නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10,

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**12 ශ්‍රේණිය**

## මානුෂ භූගෝල විද්‍යාව

**(ලෝක නාගරීකරණය)**

**ඒකක පරීක්ෂණය - 03**

## I වන කොටස

**එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.**

(1) නාගරීකරණයෙන් අඩු මහද්වීපය වන්නේ මින් කුමක් ද?

i. ඕස්ට්‍රේලියාව
ii. ආසියාව
iii. අප්‍රිකාව
iv. දකුණු ඇමරිකාව
v. යුරෝපය

(2) ලෝකයේ 100% ක ප්‍රතිශතයකින් නාගරීකරණය වූ රට වන්නේ,

i. එක්සත් රාජධානියයි
ii. ඇමරිකා එක්සත් ජනපදයයි
iii. සිංගප්පූරුවයි
iv. ජපානයයි
v. ජර්මනියයි

(3) ජන සංඛ්‍යාව අනුව 2025 වසරේදී ලෝකයේ විශාලතම නගර දෙක දක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?

i. ලන්ඩන් සහ ටෝකියෝ
ii. ටෝකියෝ සහ මුම්බායි
iii. නිව්යෝර්ක් සහ ටෝකියෝ
iv. ටෝකියෝ සහ ඩකා
v. මුම්බායි සහ කල්කටා

(4) ශ්‍රී ලංකාවේ නාගරික ජන සංඛ්‍යාව වැඩිම හා අඩුම දිස්ත්‍රික්ක දෙක පිළිවෙලින් පෙන්වන නිවැරදි පිළිතුර වන්නේ,

i. කොළඹ සහ හම්බන්තොටය
ii. කොළඹ සහ කෑගල්ලය
iii. ගම්පහ සහ හම්බන්තොටය
iv. කොළඹ සහ නුවරඑළිය ය
v. මහනුවර සහ කෑගල්ලය

(5) යුරෝපා රටවල නාගරීකරණය ආරම්භවීමට මුල් වූ පළමුවන පූර්ව අවශ්‍යතාව කුමක් ද?

i. පළාත් පාලන යාන්ත්‍රණයක් පිහිටුවීම
ii. යටත් විජිත පිහිටුවීම
iii. ග්‍රාමීය අංශයේ කෘෂිකාර්මික ආර්ථිකයක් තිබීම
iv. රටේ භූමියේ අයිතිය පෞද්ගලීකරණය
v. ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන්

(6) නාගරික මධ්‍යස්ථාන ධූරාවලිය ආරෝහණ ක්‍රමයට නිවැරදිව දැක්වෙන වරණය කුමක් ද?

i. නගරය, විශාල නගරය, නාගරික සමුහිතය, නගරයාය
ii. නගරය, නගරයාය, නාගරික සමුහිතය, විශාල නගරය
iii. විශාල නගරය, නගරය, නගරයාය, නාගරික සමුහිතය
iv. නාගරික සමුහිතය, නගරයාය, විශාල නගරය, නගරය
v. නගරය, නාගරික සමුහිතය, විශාල නගරය, නගරයාය

(7) වර්තමානයේ විශාලතම ජාත්‍යන්තර සංක්‍රමණ ධාරාව දැකිය හැකිවන්නේ,

i. බටහිර යුරෝපයේ සිට උතුරු ඇමරිකාව දෙසටය
ii. බටහිර අප්‍රිකාවේ සිට ලතින් ඇමරිකාව දෙසටය
iii. උතුරු අප්‍රිකාවේ සිට දකුණු යුරෝපයට දෙසටය
iv. නැගෙනහිර ආසියාවේ සිට උතුරු ඇමරිකාව දෙසටය
v. දකුණු ආසියාවේ සිට ඕස්ට්‍රේලියාව දෙසටය

(8) ශ්‍රී ලංකාවේ නාගරික ජනාවාසවල මෑතකාලීන ප්‍රවණතාවක් වන්නේ,

i. ඉහළ නාගරික අනුපාතයයි
ii. දිස්ත්‍රික්ක අගනගරවල ඉහළ නාගරික වර්ධනයයි
iii. කොළඹ උපනාගරික ප්‍රදේශවල පසුබසින කාර්මීකරණයයි
iv. මහ කොළඹ පුරවර ප්‍රදේශයට සිදුවන අඩු සංක්‍රමණයයි
v. කොළඹ පුරවර නගරයක් වශයෙන් සංවර්ධනය වීමයි

(9) 2050 වනවිට ලෝකයේ අධික නාගරීකරණයට පත්වන මහද්වීපය වන්නේ,

i. අප්‍රිකාවයි
ii. ආසියාවයි
iii. යුරෝපයයි
iv. උතුරු ඇමරිකාවයි
v. ලතින් ඇමරිකාවයි

(10) බ්ලූ බනානා, ගෝල්ඩන් බනානා, ග්‍රීන් බනානා යනුවෙන් හැඳින්වෙන්නේ,

i. ලෝකයේ නාගරික සමුහිතයන් ය
ii. බහුජාතික සමාගම්වල නම්ය
iii. නගර යාය ලෙස හඳුන්වන ප්‍රදේශයයි
iv. යුරෝපා කලාපයේ නාගරික ගොවිබිම්ය
v. නාගරික දේශසීම අබිබවා ව්‍යාප්ත වූ නාගරික කලාපයන් ය

## II වන කොටස

(1) (i) නාගරික ජනාවාසක කැපීපෙනන ලක්ෂණ හතරක් නම් කරන්න.

(ii) සංවර්ධිත රටවලට වැඩි වේගයකින් සංවර්ධනය වෙමින් පවතින රටවල නාගරික ජනාවාස වර්ධනය වේ. මෙයට බලපාන හේතු තුනක් විමසන්න.

(iii) ශ්‍රී ලංකාවේ කොළඹ පුරවරය තුළ විශාල වශයෙන් නාගරික ජනාවාස ඒකරාශී වීමට හේතු වූ සාධක තුනක් කෙටියෙන් දක්වන්න.

(iv) නාගරීකරණය ආශ්‍රිතව ශ්‍රී ලංකාවේ පැනනැගී ඇති ගැටලු හතරක් කෙටියෙන් සාකච්ඡා කරන්න.

(2) (i) ලෝකයේ විශාල නගරවල ජනගහනයේ සිදුවූ වෙනස්කම් තුනක් දක්වන්න.

(ii) සංවර්ධනය වෙමින් පවතින රටවල සීඝ්‍ර නාගරීකරණය කෙරෙහි බලපාන හේතු හතරක් පැහැදිලි කරන්න.

(iii) ලෝකයේ සංවර්ධනය වන රටවල සීඝ්‍ර නාගරීකරණය හා සම්බන්ධ ගැටලු පහක් සාකච්ඡා කරන්න.

(iv) ශ්‍රී ලංකාවේ මන්දගාමී නාගරික වර්ධනය කෙරෙහි බලපාන සාධක තුනක් පැහැදිලි කරන්න.

(2) (i) නාගරික ජනාවාසයක් යනු කුමක් ද?

(ii) ලෝක නාගරීකරණයේ වෙනස්වන රටා තුනක් විස්තර කරන්න.

(iii) සංවර්ධනය වෙමින් පවතින රටවල නාගරීකරණය නිසා පැන නැගී ඇති සමාජ ආර්ථික ගැටලු තුනක් විස්තර කරන්න.

(iv) ශ්‍රී ලංකාවේ කොළඹ පුරවර ප්‍රදේශයේ නාගරීකරණයේ සිදුවී ඇති වෙනස්කම් තුනක් පැහැදිලි කරන්න.